දරුවන් උදෙසා
බයිබලයක්

# ජෙරෙමියා,
# කඳුළු වැගුරූ
# මිනිසා



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Jonathan Hay
Alastair Paterson

සකස්කරන්නා: Mary-Anne S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර
ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

ජෙරෙමියා යුදා රාජධානියේ භක්තිවන්ත පවුලකට දාව උපත ලැබීය. ඔහුගේ පියා වූ හිල්කියා පූජකවරයෙකි. පවුල ජීවත් වුණේ යෙරුසලමට නුදුරු අනාතොත් නම් නගරයේ ය. සමහර විට ජෙරෙමියාගේ දෙමව්පියන් ඔහුත් පූජකයෙකු වේයැයි සිතුවා විය හැක. නමුත් දෙවියන් වහන්සේට වෙනත් සැලසුම් තිබිණි.





ජෙරෙමියා උපන් කාලයේදී,
දෙවියන් වහන්සේගේ සෙනඟ
උන්වහන්සේගේ වචනයට
අනුව ජීවත් නොවූවෝය.
රජුගේ සිට පහත්ම සේවකයා
දක්වා සෑම කෙනෙක්ම
පාහේ බොරු දෙවිවරුන්ට
නමස්කාර කළෝය - දෙවියන්
වහන්සේගේම ශුද්ධ
මාලිගාවේ පවා ඔවුහු එසේ
කළෝය.



ජෙරෙමියා
තරුණ වියේදී
දෙවියන්
වහන්සේ ඔහුට
කතා කළ සේක.
“ඔබ ඉපදීමට පෙර
සිට මම ඔබව දැන සිටියෙමි”යි දෙවියන් වහන්සේ
ජෙරෙමියාට කීසෙ◌්ක. “මා වෙනුවෙන් කතා
කිරීමට මම ඔබව සැලසුම් කළෙමි”.

දෙවියන් වහන්සේගේ කැඳවීම ජෙරෙමියාව බිය ගැන්වූ බවක් පෙනෙන්නට තිබුණි. “අහෝ ස්වාමිවූ  දෙවියන් වහන්ස!” ඔහු කෑගැසුවේය. “මම කතා කරන්න නොදනිමි, මම බාලයෙක්මි”යි ඔහු කීවේය. නමුත්  ඔහු දරුවෙකුට වඩා වයසින් වැඩි විය - ඔහුට වයස අවුරුදු විස්සක් වූයේය. නමුත් ජෙරෙමියා තමන් වටා තිබෙන දුෂ්ටකමට විරුද්ධව දෙවියන් වහන්සේ වෙනුවෙන් කතා කරන්න ඔහුට හැකිවේයැයි නොසිතුවේය.



“බිය නොවන්න,” දෙවියන් වහන්සේ ජෙරෙමියාට සහතිකයක් දුන් සේක. “මම ඔබව යවන ඕනෑම තැනකට යන්න. මම ඔබට පවසන ඕනෑම දෙයක් කියන්න.



මම ඔබ සමඟ සිටිමි, මම ඔබව මුදාහරින්නෙමි.” ඉන්පසු දෙවියන් විශේෂ දෙයක් කළ සේක. දෙවියන් වහන්සේ ජෙරෙමියාගේ මුඛය ස්පර්ශ කළ සේක.

දෙවියන් වහන්සේ ජෙරෙමියාට ශක්තිය, ධෛර්යය සහ ප්‍රඥාව දුන් සේක. ඔහු නිර්භීතව කතා කරමින් දෙවියන් වහන්සේ ජනතාවට ප්‍රේම කරන බවත් ඔවුන්ට උපකාර කිරීමට උන්වහන්සේට අවශ්‍ය බවත් මිනිසුන්ට මතක් කර දුන්නේය. නමුත් කිසිවෙකු ඔහුට ඇහුම්කන් දුන්නේ නැත.

රජතුමාවත් ඇහුම්කන් නොදුන්නේය.



පූජකවරු පවා කෝපයට පත් වී දෙවියන් වහන්සේ ගැන කතා කිරීම නවත්වන ලෙස ඔහුට පැවසුවෝය. ජෙරෙමියා සත්‍ය නොකියන බව පැවසූ බොරු අනාගතවක්තෘවරුද සිටියෝය.



වසර සියයකට පමණ පෙර ඊශ්‍රායලයේ උතුරු රාජ්‍ය දෙවියන් වහන්සේව අත්හැර දැමූ බව ජෙරෙමියා ජනතාවට මතක් කළේය. ඔවුන්ගේ සතුරන් වූ අසිරියානුවෝ ඔවුන්ව යටත් කර ගෙන ඊශ්‍රායෙල්වරුන් සියලුදෙනාවම ඈත රටවලට ගෙන ගියෝය.





දැන් දකුණු ජුදා රාජ්‍ය
වැසියන් දෙවියන්
වහන්සේ හැර ගොසිනි.
සතුරු හමුදා ඒ වන
විටත් පැමිණෙමින්
සිටියෝය! දෙවියන්
වහන්සේ තම සෙනඟ
ඒ සතුරු හමුදාවන්ට
යටත් කරගන්න ඉඩදී
පිටුවහල් කර දමන
සේක්ද?

මිනිසුන් ඔවුන්ගේ පිළිම ගැන විශ්වාසය තැබුවෝය. පිළිමවලට ඔවුන්ගේ සතුරන්ගෙන් ඔවුන්ව ගලවා ගත හැකිද? නැත! ඔවුන්ව බේරාගත හැක්කේ දෙවියන් වහන්සේට පමණී. සෙනඟ ජෙරෙමියා කෙරෙහි කොතරම් කෝපයට පත් වූවාද කියතොත් ඔහුව මරන්නට කුමන්ත්‍රණය කළෝය. නමුත් දෙවියන් වහන්සේ තම සේවකයාව ආරක්ෂා කළ සේක.



අවසානයේදී, දෙවියන්
වහන්සේ ජෙරෙමියා
කම්පනයට පත් කරන
දෙයක් පැවසූ සේක. “මේ
සෙනඟ වෙනුවෙන්
යාච්ඤා නොකරන්න,
ඔවුන් මට උදව් ඉල්ලා
කෑගසන විට මට ඔවුන්
ගේ හඬ ඇසෙන්නේ
නැතැ”යි දෙවියන්
වහන්සේ කීසේක.



බබිලෝනියේ හමුදාව සමඟ
කරන සටනින් රජු පරාජය
වන බවට ජෙරෙමියා අනතුරු
ඇඟවීය. රජු කෝපයට පත් වී
ජෙරෙමියාව සිරගත කළේය.
සිරගෙදරදී පවා ජෙරෙමියා
දිගටම දේශනා කරමින්
දෙවියන් වහන්සේ කෙරෙහි
විශ්වාසය තැබුවේය.



සිරගෙයින් එළියට ආ පසු ජෙරෙමියා නැවතත් රජුට සහ සෙනඟට දේශනා කරමින් දෙවියන් වහන්සේ වෙත හැරී උන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබන ලෙස කීවේය. මේ වතාවේ, රජතුමා ජෙරෙමියාව ගැඹුරු මඩ සහිත සිරගෙයකට බස්වා තැබුවේය.



එහෙත් දෙවියන් වහන්සේ රජුගේ සිතෙහි වැඩහිඳි සේක. රජතුමා රහසිගතව ජෙරෙමියාව බේරාගෙන දෙවියන් වහන්සේට රජුගෙන් අවශ්‍ය වන්නේ කුමක්දැයි ඔහුගෙන් ඇසුවේය. “වහල්භාවයට යන්න, එවිට ඔබ ජීවත් වනු ඇතැයි දෙවියන් වහන්සේ පවසන සේක” යන්න ඔහුට ලැබුන පිළිතුර විය.



බබිලෝනියානු හමුදාව ජෙරුසලම සහ මුළු ජුදයාව යටත් කර ගත්තෝය. ඔව්හු බිත්ති ද සියලු ගොඩනැඟිලි ද බිම හෙළා, සියල්ල ගිනිබත් කළෝය. දෙවියන් වහන්සේ, උන් වහන්සේගේ සෙනඟ අවුරුදු හැත්තෑවක් වහල්භාවයට යන බවත්, පසුව උන්වහන්සේ ඔවුන්ව පොරොන්දු දේශයට ගෙන එන බවත් පැවසූ සේක.



ජෙරෙමියා, කඳුළු වැගුරූ මිනිසා

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ජෙරෙමියා

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය 119:130**

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත.
ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)